**CORGI Registered Central Heating Engineer**
**Reliable, friendly. Any work not too small**
කුඩා හෝ මහා පරිමාණයේ හෝ ඕනෑම
සෙන්ට්‍රල් හීටිං කාර්යයක් සඳහා විමසන්න.
දක්ෂ, එමෙන්ම විශ්වාසවන්ත සේවය
නාමල් Namal - 0 7 9 5 8 7 2 0 9 1 2

**Domestic Part P & BS7671 Qualified**
**Professional Electrical Engineer**
All electrical work carried out
Testing-Inspecting and Certification of all work
All jobs undertaken with guarentee
ගෘහස්ත සියළු විදුලි කාර්මික කටයුතු සඳහා
ප්‍රවීන විදුලි ඉන්ජිනේරු ශිල්පී සේවය
Call - රන්ජිත් Ranjith on 07904174241

**ලිහිණියා LIHINIYA**
ශ්‍රීලංකා අවන්හල සහ වෙළඳසල
වසර 20 ක අඛණ්ඩ මිත්‍රශීලි සේවය
කුළුබඩු වර්ග ඇතුළු විවිධ ශ්‍රීලංකා නිශ්පාදන
ප්‍රණීත ආහාර සැපයීමේ පුරෝගාමියෝ
එවලේම පිළියෙල කරන ආප්ප, ඉඳිආප්ප
පිට්ටු, රොටි කොත්තු, බුරියානි
උත්සව සඳහා ඇණවුම් බාරගනු ලැබේ.
Tel. 0208 450 9052
66 Cricklewood Broadway, London NW2 3EP

**UK VISA SERVICES UNDER POINT BASED SYSTEM AND TRADITIONAL ROUTES INCLUDING APPEALS BEFORE THE TRIBUNAL**
We are authorised by the Office of the Immigration Services Commissioner to give immigration advice
And provide all related services
**Colvin L. De Silva - Immigration Advisor**
Tel. 020 8906 3747 Fax: 020 8959 1334
Mobile 07956 502019
(Please phone for an appointment)

වසර ගණනාවක් පුරා ශ්‍රීලාංකික ජනතාවගේ හදවතට
වඩාත් සමීපව කටයුතු කරන නැව් බඩු ආයතනයයි
**සත්සමුදුර ජයගත් ට්‍රයිකෝ**
♦ ට්‍රයිකෝ - කොළඹ
50 සිරිල් සී පෙරේරා මාවත
කොළඹ 13
දුරකතනය 4 4 8 2 7 0 / 4 3 2 2 3 6
♦ ට්‍රයිකෝ - ගාල්ල ♦ ට්‍රයිකෝ - කුරුණෑගල
සතියක් ඇර සතියක්, එනම් මසකට දෙවරක්
ට්‍රයිකෝ නැව්බඩු ලංකාවට යැවේ.
දින 17 කින් ඒවා ලංකාවට ළඟාවේ.
**TRICO**
**Shipping & Forwarding Ltd**
555 White Hart Lane
London N17 7RP
Telephone 0 2 0 8 8 8 8 8 7 8 7
Fax 0 2 0 8 8 8 9 5 4 4 5
E-Mail : trico@tricoshipping.com
නැව්බඩු සඳහා පූර්ණ විශ්වාසය තැබිය හැකි ආයතනය



## බඩු නැතිවෙලා

ගුවන් තොටුපලේ හිස් බෝතලයකුත් කිහිල්ලේ ගසාගෙන බීමත් පුද්ගලයෙකු වැලපෙන අන්දම දුටු රේගු නිලධාරියෙක් ඔහු වෙත ගියේය.

"මොකෝ මේ අඩා වැටෙන්නෙ? මොකක්ද හැබෑට ඔහේට වුණේ ? "

" නේ සර් මගේ බඩු ඔක්කොම නැතිවුණා"

" කොහොමද ඒක වුණේ... ?"

" මම දන්නෙම නැතුව මූඩිය ගැලවිලා....! "

## බය වෙන්න හේතුව

තම යහළුවා වන නිමල් වෙන ගෙයක් සොයන බව ඇසූ සිරිපාල ඔහු හමුවන්නට ආවේය.

"මොකද මචං වෙන ගේකට යන්න හිතුවෙ?"

" මගේ වයිෆ් මාව දාලා ගියා නේ.... මට දැන් ගෙදර ඉන්න බයයි...."

" මට තේරෙනවා..... කාලයක් එකට හිටපු දෙන්නෙක් නේ.... ඒත් ඉතින් වෙන ගේකට ගියත් තනියම නේ.... එත කොටත් බය හිතේවි නේ...."

" නෑ... නෑ... මට මෙහේ ඉන්න බය, එයා ආයිත් ආවොත් කියලා..."

## කිමිදීමේ හැකියාව

නාවික හමුදාවට බැඳීමේ සම්මුඛ පරීක්ෂණයේදී එක්තරා අපේක්ෂකයෙකුගෙන් මෙසේ අසනලදී

**පරීක්ෂක :** හොඳයි දැන් තමන්ට කොච්චර දුර කිමිදෙන්න පුළුවන්ද?

**අපේක්ෂක :** මීටර් 20 ක් 25 ක් විතර

**පරීක්ෂක:** මොනව? මේ මෙච්චර වයසක මමත් 30 ක් 35 ක් කිමිදෙනව නේ...

**අපේක්ෂක:** අපෝ! මටත් පුළුවන් 30 ක් 35ක් නෙවෙයි, 50 ක් වුනත් පහළට කිමිදෙන්න.... හැබැයි ඉතින්.... ආපහු එන්න පුළුවන් වෙයිද දන්නෙ නැහැ....

## අනාගත අපේක්ෂා

මිතුරන් හතර දෙනෙක් තම අනාගත අපේක්ෂාවන් ගැන කතාකරමින් සිටියෝය.

" මං කැමතියි හමුදා නිලධාරියෙක් වෙන්න.... එතකොට මට පුළුවනි මගේ රටවැසියන් ආරක්ෂා කරන්න...."

" මං කැමතියි ඇමති කෙනෙක් වෙන්න.... එතකොට මට පුළුවන් මගේ රටවැසියන්ගේ ජීවන තත්වය උසස් කරන්න....." දෙවැන්නා කීවේය.

තුන් වැන්නා මෙසේ කීවේය.

" මං කැමතියි දොස්තර කෙනෙක් වෙන්න.... එතකොට මට පුළුවන් මගේ රට වැසියන්ව සුවපත් කරන්න...."

සිව්වැන්නා ලොකු කල්පනාවක ගැලී සිටිනු දුටු මිතුරෝ ඔහුගෙන් මෙසේ ඇසූහ.

" මචං උඹ කැමති කවුරු වෙන්නද? "

" මං එහෙනම් මචං රටවැසියෙක් වෙන්නම්..... "

## කෙහෙල්කැන

විමලදාස කෙහෙල් කැනකුත් කර තබාගෙන ගමේ තේ කඩේට ගොඩවිය.

**මුදලාලි :** ඇයි බං උඹ පැහෙන්නත් ඉස්සෙල්ලා මේ කෙහෙල් කැන කපාගෙන ආවෙ?

**විමලදාස :** අපෝ මුදලාලි පැහෙන කල් හිටිය නම් අයිතිකාරය කපාගෙන යනව නේ.....

**SHORT HOLIDAY LET**
Luxury apartments in Rosmead Place, Colombo 7.
Air conditioned, Hot water, Swimming pool, Roof garden, 2 bed rooms. $50 per day, minimum 3 days
email: norma5000@gmail.com
Tel: 0771717 3414
07768055668

Community Legal Service
**ANTONS**
**SOLICITORS**
Community Legal Service
For Quality Services
We offer a comprehensive range of Legal Services.

Conveyancing
- Sale & Purchase
- Right to buy (Council House)
- Re-Mortgage
- Assignment of Lease
- New Lease
- Licensing Applications
- Contractual Disputes

Immigration
- Asylum cases
- Asylum Application
- Judicial Reviews
- Extensions of Visas
- Marriage Applications
- Work Permits
- Business Visas

*For a fee of £299 for Residential, £599 for Commercial excluding vat & disbursement*
**Contact -** Mrs Rani Bulathwela 0 7 8 0 8 1 5 8 3 6 0
Rohitha – 0 7 9 5 6 5 4 9 4 4 7 Nihal – 0 7 9 3 0 3 1 0 9 6 7
Vajira – 0 7 8 8 7 8 4 0 2 2 7
**ANTONS SOLICITORS**
14 Wordsworth House, Wordsworth Parade
London N8 0SJ
Tel. 0208 888 6211 Fax 0208 888 1403
*E-mail :* antons.solicitors@btopenworld.com

ලංකා විත්ති පුවත්පතේ පළවන ලිපි අදහස් හා දැන්වීම් ඒවා පළකරන අයගේය. ඒ පිළිබඳව කර්තෘගේ කිසිදු වගකීමක් නැත. **ලංකාවිත්ති පත්‍රය අවුරුද්දක් ඔබේ ගෙදරට ගෙන්වාගන්නට පවුම් 11 ක චෙක්පතක් *Lanka Viththi* යනුවෙන් ලියා පහත ලිපිනයට එවන්න.**
**Lanka Viththi, P. O. Box 64678, London NW3 9LS**




# Driver Fined For Blowing His Nose
# හොටු හීරුවාට රියැදුරාට පවුම් 60ක් දඩ!

A motorist in **Scotland** has been handed a **£60** fine and three points on his licence for blowing his nose while behind the wheel of his car.

Stunned **Michael Mancini** was handed the fine after he pulled out a tissue and wiped his nose while he was sat in stationary traffic with his handbrake on. **PC Stuart Gray** promptly flagged Mancini down and handed him the punishment for allegedly being 'not in proper control of his vehicle'.

"I honestly thought it was a joke," said 39 year-old Mancini, who plans to appeal against the punishment. "I was just completely gobsmacked, we came to a complete stop and I thought that was quite a good time to blow my nose."

PC Gray has a track record of issuing fines for minor offences - a few months ago he attracted publicity for handing a £50 fine to a man that accidentally dropped a £10 note in the street.

Although Mancini could end up out of pocket as a result of his appeal, he intends to press on and and see it through to the end in an attempt to get the police to **"see some common sense."**

ස්කොට්ලන්තයේ රියැදුරෙකුට රථය තුළ හිඳ හොටු හීරුවාට පවුම් 60 ක දඩයක් පොලිස් නිලධාරියෙකු විසින් නියමකරනු ලැබ ඇත. මයිකල් මැන්සිනී නම් ඔහු සිය රථය පදවාගෙන ගමනක් යන අතර තුර වාහන තද බදයක් නිසා දිග රථ පේලියක තම රථය නතර කර ගෙන සිටියේය. එවෙලේ රථයේ බ්‍රේක්ද ඇද තිබුණි. සෙම්ප්‍රතිශ්‍යාවෙන් පෙළුණ ඔහු ටිෂූ එකක් ගෙන හොටු සීරු වේය. එය දුටු ස්ටුවර්ට් ග්‍රේ නම් පොලිස් නිලධාරියා වහා මැන්සිනී වෙතට ගොස් රථය ක්‍රමවත්ව පාලනය නොකළේය යන චෝදනාව නගා පවුම් 60 ක දඩ කොළයක් ලියා මැන්සිනීට දුන්නේය.

" ඇත්තට මම මුලින් හිතුවෙ ඒක පොඩි විහිළුවක් කියලා. මේක මහ පුදුම වැඩක්. මට අදහාගන්න බෑ. කොයි ලෝකෙද හොටු හූරන්න තහනම්? මම මේ දඩය ගෙවන්නෙ නැහැ. මම අභිආයාචනයක් කරනවා." රියැදුරා කියයි.

මේ පොලිස් නිළධාරියා මෙවැනි දඩ වලට ප්‍රසිද්ධය. මාස කීපයකට පෙර වැරදීමකින් කෙනෙකු පවුම් දහයේ කොළයක් බිම වැට්ටුවාට ඔහුට පවුම් 50 ක දඩ කොළයක් ලියා දී ඇති බව කියති.